**සී. එෆ්. සී. ෆවුන්ඩීන් (ඇපයෙන්) සීමිත සමාගම - 2016/ 2017**

**-------------------------------------------------------------**

සී. එෆ්. සී. ෆවුන්ඩීන් (ඇපයෙන්) සීමිත සමාගමේ ("සමාගම") 2017 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් මාස තුනක (03) කාලය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 මාර්තු 31 දිනෙන් අවසන් මාස තුනක (03) කාලය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළයුතු යැයි අදහස් කරන සමාලෝචිත මාස තුනක (03) කාලයේ සමාගමේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්ථාවේ දැක්වේ .

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම**

**-----------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ ("මණ්ඩලය") වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. අචාරධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන් වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 ආයතනය පිහිටුවීම

“මූල්‍ය නගරය - ඇපයෙන් සීමිත සමාගමක් ස්ථාපිත කිරීම” යන මැයෙන් වූ අංක 16/2694/702//054 - 1 හා 2016 දෙසැම්බර් 16 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව සඳහා 2016 දෙසැම්බර් 20 දින ලද අනුමැතිය මත සී. එෆ්. සී. ෆවුන්ඩ්ින් (ඇපයෙන්) සීමිත සමාගම 2016 දෙසැම්බර් 27 දින පිහිටුවා තිබුණු අතර 2017 මාර්තු 31 දිනෙන් අවසන් මාස තුනක (03) කාලය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2019 අගෝස්තු 23 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 මාර්තු 31 දිනට සී. එෆ්. සී. ෆවුන්ඩ්ින් (ඇපයෙන්) සීමිත සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් මාස තුනක (03) කාලය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2007 අංක 7 දරන සමාගම් පනතේ 163 (2) වගන්තියේ නිගමනය පරිදි පහත ප්‍රකාශ සිදු කරමි.

(අ) මතය සඳහා පදනම හා විෂය පථය සහ විගණනයේ සීමා කිරීම් පහත පරිදි දක්වනු ලැබේ.

(ආ) තත්ත්වාගණනය කල මතය සඳහා වූ ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු හා පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලද බවත් මාගේ පරීක්ෂයෙන් පෙනී යන අන්දමට සමාගම විසින් විධිමත් ගිණුම් වාර්ථා පවත්වා ඇති බවත්,

සමාගමේ මූල්‍ය ප්‍රකාශවන 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියෙහි අවශ්‍යතාවයට හා අනකූළ වන බවත් මා දරන්නා වූ මතය වේ.

## 2.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.3.1. ගිණුම්කරණ අඩුපාඩු

2017 මාර්තු මාසයට අදාළ රු.504,761 ක් වූ වෘත්තීය ගාස්තු මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත මාස තුනක (03) කාලය සඳහා සමාගමේ මෙහෙයුම් ආදායම මෙහෙයුම් වියදමට සමානවූ අතර රු.2,352,147 ක්වූ මුළු මෙහෙයුම් අදායමම භාණ්ඩාගාර ප්‍රදානවලින් සමන්විත විය.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

මූල්‍ය නගර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන්නාවූ නීතිමය ලේඛනය කෙටුම්පත් කිරීම වෙනුවෙන් මෙම සමාගම පිහිටුවා තිබුණු අතර කෙටුම්පත් කරන ලද කොළඹ මූල්‍ය නගර පනත නීතිපති දෙපාර්තමේන්තුව වෙත 2019 අප්‍රේල් මස ඉදිරිපත් කර තිබුණි.

## 5. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5 .1 ඡේදය ප්‍රකාරව ආයතනය විසින් කෙටුම්පත් වාර්ෂික මූල්‍ය ප්‍රකාශන වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, සමාගම 2017 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ 2019 අගෝස්තු 23 දිනදීය.